ඒකාබද්ධ ලේකම් හා භාණ්ඩාගාරික තනතුර සහ සහකාර ලේකම් තනතුර සඳහා අයදුම්පත් කැඳවීම

රාජ්‍ය සේවා අන්‍යොන්‍ය අර්ථසාධක සංගමය

(1891 අංක 5 දරණ රාජ්‍ය සේවා අ.අ.සංගම් ආඥා පනත යටතේ සංස්ථාගතයි.)

මෙම සංගමයේ පහත සඳහන් තනතුරු (2) සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

1. ඒකාබද්ධ ලේකම් හා භාණ්ඩාගාරික තනතුර

සුදුසුකම්

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ හෝ ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ III පන්තියේ හෝ විගණන පරීක්ෂක සේවයේ 1 පන්තිය හෝ රාජ්‍ය / පළාත් කළමනාකරණ සහකාර සේවයේ අධි ශ්‍රේණියේ නිළධාරියකු වීම.

2. සහකාර ලේකම්

රාජ්‍ය හෝ පළාත් රාජ්‍ය කළමනාකරණ සේවය 1 පන්තියේ නිළධාරියෙකු වීම.

පළපුරුද්ද

ගිණුම් කටයුතු, ආයතන හා පරිපාලන කටයුතු පිළිබඳ පළපුරුද්දක් සහ සිංහල සහ ඉංග්‍රීසි භාෂා පිළිබඳ ප්‍රවීණත්වයක් තිබිය යුතුය. දෙමළ භාෂාව පිළිබඳ දැනුම අතිරේක සුදුසුකමක් වේ.

වැටුප් හා අනෙකුත් වරප්‍රසාද

* මෙම ආයතනය මුදල් අමාත්‍යාංශයට අයත් ආයතනයක් බැවින් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්යය පටිපාටික රීති සංග්‍රහයේ 11 වන පරිශිෂ්ඨය මඟින් ඔබගේ අයදුම්පත්‍රය ඉදිරිපත් කල හැක.
* මෙම තනතුර සඳහා තෝරා ගනු ලබන නිළධාරියාට තමා දැනට ලබන රජයේ වැටුප් පරිමාණයට සමාන වැටුප සහ මාසික ඒකාබද්ධ වැටුපෙන් 50% ක අතිරේක දීමනාවක්.
* ප්‍රවාහන දීමනා හැර රජයේ අනුමත වෙනත් දීමනා.
* සංගමයේ වාර්ෂික මහා සභා රැස්වීමේදී තීරණය කරනු ලබන වාර්ෂික ප්‍රසාද දීමනා සහ වාර්ෂිකව ඉතිරි කර ගන්නා නිවාඩු වෙනුවෙන් දීමනා.
* අනුග්‍රහ වාර ප්‍රවේශ පත්‍ර හා නිදහස් දුම්රිය ගමන් බලපත්.

කොන්දේසි

තෝරා ගනු ලබන අයදුම්කරු රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යය පටිපාටික රීති අනුව හා / හෝ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ විධිවිධාන පරිදි සංගමයේ සේවය සඳහා වර්ෂ දෙකක කාලයක් මුදාහැරිය හැකි බවට දෙපාර්තමේන්තු ප්‍රධානියාගෙන් සහතිකයක් ඉදිරිපත් කළ යුතුය.

තෝරා ගනු ලබන අයදුම්කරු රා.සේ.අ.අ සංගමයේ කළමනාකරණ කමිටුව විසින් තීරණය කරනු ලබන මුදලක් සංගමයට ඇපයක් ලෙස තැබිය යුතුය,

අයදුම්කරුවන් සිය අයදුම්පත් ඉදිරිපත් කිරීමේදී ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවරේ තමා ඉල්ලුම් කරන තනතුර සඳහන් කර සභාපති, රාජ්‍ය සේවා අන්‍යොන්‍ය අර්ථසාධක සංගමය, අංක 155/5, කාසල් වීදිය, කොළඹ 08 යන ලිපිනයට තම ආයතන ප්‍රධානියා මඟින් 2019.10.04 දින ප.ව. 2.00 ට පෙර ලියාපදිංචි තැපෑලෙන් ඉදිරිපත් කළ යුතු අතර, ප්‍රගමණ පිටපතක් රාජ්‍ය සේවා අන්‍යොන්‍ය අර්ථසාධක සංගමය වෙත යොමු කරන්නේ නම් වඩාත් පහසු බවද කාරුණිකව දන්වමි.

ආර්.ඒ.ටී.ඒ.රණවීර
සභාපති.

රාජ්‍ය සේවා අන්‍යොන්‍ය අර්ථසාධක සංගමය,
අංක 155/5,
කාසල් වීදිය, කොළඹ 08.
2019.09.10.
දුරකථන : 0112 665 228 / 29
ඊ මේල් : psmpa@sltnet.lk / වෙබ් : www.psmpa.com